www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# එක් තීරුවක්, එක් මාවතක්: ඇමරිකානු ‘හැරීමට’ චීනයේ ප්‍රතිචාරය

## One Belt, One Road: China’s response to the US "pivot"

**පීටර් සිමන්ඩ්ස්**
**2015 දෙසැම්බර් 04**

පසුගිය සතියේ පැවැත්වූ ඒපෙක් හෙවත් ආසියානු පැසිෆික් ආර්ථික සහයෝගිතාව හා නැගෙනහිර ආසියානු සමුලුව යන ඉහල පෙලේ සමුලු වලදී ඇමරිකානු ජනාධිපති බරක් ඔබාමා, ටීපීපී හෙවත් අන්තර් පැසිෆික් හවුල්කාරිත්වය හා කලාපය පුරා මිලිටරි සම්බන්ධකම් හා සන්ධාන ස්ථාපිත කර ගැනීම යන සියල්ල චීනයට එරෙහිව යොමුකරමින්, යලි වතාවක් සිය "ආසියාවට හැරීමේ" න්‍යාය පත්‍රය අවධාරනය කිරීම පිනිස දකුනු චීන මුහුදේ නාවික ගමනාගමනය පිලිබඳ මතභේද ගසා කෑවේය.

2011දී "හැරීම" නිල වශයෙන් ප්‍රකාශ කිරීමට පෙර සිටම ඔබාමා පාලනය, ගැඹුරුවන ගෝලීය ආර්ථික බිඳ වැටීමට ප්‍රතිචාර වශයෙන්, ඇමරිකානු පරමාධිකාරයට චීනයෙන් එල්ල වන තර්ජනය වැලැක්වීම සඳහා වන සිය යොමුව, ඉන්දු-පැසිෆික් කලාපය වෙත හැරවීමට පටන්ගෙන තිබුනි. හුදෙක්ම චීන ආර්ථිකයේ විශාලත්වය, ඇමරිකානු අධිකාරයේ පදනම මත දෙවන ලෝක යුද්ධයේ අවසානයෙන් පසුව පිහිටුවා ගන්නා ලද දිගුකාලීන ආර්ථික හා මූලෝපායික සම්බන්ධතාවන්ට හරස්ව නැගෙමින් තිබුනි.

චීනය බැහැර කර පිහිටුවන ලද ටීපීපී හා කලාපය පුරා ගොඩනැගෙමින් ඇති ඇමරිකානු මිලිටරි පෙරමුන හමුවේ, චීන බලධාරීන්ට ඊට ප්‍රතික්‍රියා නොදක්වා සිටිය නොහැකි වී ඇත. පසුගිය දශක තුන තිස්සේ ධනපති පුනස්ථාපන ක්‍රියාවලිය තුලින් මඬි තරකරගෙන නැගී ආ සුපිරි ධනපතීන්ගේ තුනී ස්ථරයක් වන ඔවුන්ගේ ප්‍රතිචාරය පන්නර ගැන්වුනේ, ඔවුන් නියෝජනය කරන පන්ති අවශ්‍යතා මගිනි. පුලුල් වශයෙන් වොෂින්ටනය සංසිඳුවීමට උත්සාහ කරන අතරම බීජිනය, එක් ක්‍රමයකට පමනක් අවසන් විය හැකි එනම්, අවි තරගයට බැසගෙන තිබේ.

ජනාධිපති සී ජින්පින් හා අගමැති ලී කෙක්වාන්ගේ නව නායකත්වය 2013දී, පවත්නා විදේශ පිලිවෙතේ අංශ එකට එක් කල හා පුලුල් කල භූ දේශපාලනික මූලෝපායක් වර්ධනය කලහ. එහි අරමුන, ඇමරිකාව හා එහි සහචරයින් විසින් චීනය මූලෝපායිකව වටලනු ලැබීමෙන් ගැලවී යාම හා චීන ධනවාදය සඳහා නව වෙලඳ හා ආයෝජන අවස්ථා විවෘත කර ගැනීමය. සේද මාවතේ ආර්ථික තීරුව හා 21වන සියවසේ සේද මාවත නැතිනම් එක් තීරුවක් එක් මාවතක් (ඕබීඕආර්) ලෙස ප්‍රකට, යුරේසියානු භූ ස්කන්ධය මෙන්ම අප්‍රිකාව ද මුහුදෙන් හා ගොඩබිමෙන් එකට යා කරන, දැවැන්ත යටිතල ව්‍යුහ ව්‍යාපෘතියකි ඒ.

සැලකිය යුතු යටිතල ව්‍යුහ ආයෝජනයක් මෙන්ම වඩ වඩාත් වෙලඳාම හා ආර්ථික වාසි අත්කර දීම මගින් බීජිනයේ අපේක්ෂාව වූයේ, යුරේසියාවේ, මැද පෙරදිග හා අප්‍රිකාවේ රටවල් සිය සැලැස්ම තුලට ඇද ගැනීමෙන්, ඇමරිකාවේ "හැරීම" වඳ කර දැමීමයි.

ක්වාලාලම්පූර්හි පැවති නැගෙනහිර ආසියානු සමුලුවේදී චීන අගමැති ලී, දකුනු චීනයේ සිට ගිනිකොන දිග ආසියාව පුරා ගොඩබිම් ගමනා ගමන සම්බන්ධකම් ගොඩනැගීමට මෙන්ම කලාපයේ වරාය පහසුකම් වැඩි දියුනු කිරීමට චීනයේ කැපවීම සලකුනු කරන ආයාචනයක්, ආසියාන් රටවල නායකයින් වෙත නිකුත් කලේය. චීන-ආසියාන් විශේෂ යටිතල ව්‍යුහ නය සැලැස්මේ ඊලඟ අදියර සඳහා ඔහු ඩොලර් බිලියන 10ක් ලබාදීමට පොරොන්දු විය.

2020 වන විට ඩොලර් ට්‍රිලියනයක් දක්වා ඉහල නැංවීමට සැලසුම් කර ඇති, චීනය හා ආසියාන් රටවල් අතර දෙපැත්තට කෙරෙන වෙලඳාම ද ඇතුලු ආර්ථික සම්බන්ධතා ප්‍රවර්ධනය මෙන්ම ගොඩබිම් යා කිරීමේ, මූලෝපායික අරමුනක් ද පවතී. එනම් මැද පෙරදිගින් හා අප්‍රිකාවෙන් බලශක්තිය හා අමු ද්‍රව්‍ය ආනයනයේදී චීනය ගිනිකොන දිග ආසියාව හරහා දිවෙන මුහුදු මාර්ග මත රැඳී පැවතීමේ තත්වය ලිහිල්කර ගැනීමය. චීනයට එරෙහි සිය යුද සැලසුම්වල තීරනාත්මක කොටසක් ලෙස, මැලැක්කා සමුද්‍ර සන්ධියේ පාලනය ද ඇතුලු නාවික වැටලීමක් ඇමරිකානු මිලිටරි මූලෝපායඥයින් විසින් සැලකිල්ලට ගනු ලබන බව බීජිනය හොඳින් දැන සිටියි.

පසුගිය සතියේදී චීනය, හතරවන චීන-නැගෙනහිර යුරෝපීය සමුලුව පැවැත්වීය. එහිදී ලී, "යුරෝපයට හා එක් තීරුවක් එක් මාවතක් වැඩ පිලිවෙලට අයත් වන රටවල් කරා වන නැගෙනහිර පිවිසුම ලෙස" නැගෙනහිර යුරෝපයේ, බෝල්කන්හි හා බෝල්ටික් රටවල ක්‍රියාකලාපය ගෙනහැර දැක්වීය. "චීන-යුරෝපීය ගොඩබිම් හා මුහුදු සීඝ්‍රගාමී මාවත ගොඩනැගීමේදී හා යුරෝපය තුලට පිවිසුම ඇති කිරීමේදී" අදාල වන රටවල් 16 සමගම කටයුතු කිරීම අවශ්‍ය වන බව ඔහු සඳහන් කලේය. හන්ගේරියාවේ හා සර්බියාවේ අගනුවරවල් එකට යා කරන අධි වේග දුම්රිය මාර්ගයක් ඉදිකිරීමට චීනය එම දෙරට සමග ගිවිසුමක් අත්සන් තැබීය. එය ග්‍රීක වරායක් වන පිරාඉයස් යා කරන දුම්රිය මාර්ගයක් පිලිබඳ පුලුල් සැලැස්මක කොටසක් විය. එසේම ලී, බෝල්ටික්හි, ඇඩ්‍රියාතික් හා කලු මුහුදු ප්‍රදේශවල වරාය පහසුකම්වල ආයෝජන පිලිබඳව ද සඳහන් කල නමුත් විස්තර නොදැක්විය.

බීජිනයේ හඬ සියල්ලටත් වඩා යොමු වුනේ, ඇමරිකාව සමග නේටෝ මිලිටරි සන්ධානයට ඇතුලුව සිටින කොටස්කරුවන් වන ප්‍රමුඛ යුරෝපීය බලවතුන් වෙතය. වසර ගනනාවක් තිස්සේ චීනයේ යුරෝපීය රාජ්‍ය තාන්ත්‍රික කටයුතු වැඩි වර්ධනය වී ඇති අතර ඔක්තෝබර් අග හා නොවැම්බර් මුල සිදුවූ ජනාධිපති සී ගේ බ්‍රිතාන්‍ය සංචාරය, ප්‍රන්ස ජනාධිපති හා ජර්මානු චාන්සලර්වරියගේ චීන සංචාර යන ප්‍රධාන රාජ්‍ය නායකයින් තිදෙනාගේ සංචාර, චීනය සඳහා මෙන්ම යුරෝපය සඳහා ද බෙහෙවින් වැදගත් ආර්ථික හා මූලෝපායික ප්‍රශ්න මතු කර තිබේ.

බ්‍රිතාන්‍ය, ප්‍රන්සය හා ජර්මනිය යන අධිරාජ්‍යවාදී බලවතුන් තිදෙනාට, නරක අතට හැරෙන ගෝලීය ආර්ථික බිඳ වැටීම හා විශේෂයෙන්ම යුරෝපීය පසුබෑම මගින් තවත් උත්සන්න කර තිබෙන, තමන්ගේම අධිරාජ්‍යවාදී අභිලාෂයන් ඇත. ලෝකයේ විශාලතම ලාභ ශ්‍රම වේදිකාව හා දෙවන විශාලතම ආර්ථිකය ලෙස චීනයේ නැගීම සමග ඇමරිකානු, ජපාන හා යුරෝපීය සියලු බලවතුන්, සිය ආර්ථික හා ආයෝජන මැදිහත්වීම හා එමගින් බීජිනය තුල සිය අනසක වැඩිකර ගැනීමට තල්ලු විය.

*Europesworld.org* (යුරොප්ස්වර්ල්ඩ්.ඕර්ග්) වෙබ් අඩවිය මැයි මාසයේදී පල කල ලිපියක් තුල, චීන-යුරෝපීය ශාස්ත්‍රාලික ජාලයේ අධ්‍යක්ෂ වැන් යිවේ, චීනයේ මූලෝපායික අරමුනු විවෘතව එලි දැක්වූයේ මෙසේය: "ඇමරිකාවේ නැගීමත් සමග, යුරෝපය ඒකාග්‍ර වීම මගින් තත්වය වෙනස් කිරීමට මෑතකදී දරන ලද උත්සාහය අසාර්ථක විය. යුරේසියාව පුනර්ජීවනය කිරීම හරහා ලෝකයේ හරි මැදට යලි පැමිනීම සඳහා දැන් යුරෝපයට උදාවී ඇත්තේ, මහඟු

අවස්ථාවකි."

මේ අදියරේදී එක් තීරුවක් එක් මාවතක් සැලැස්ම බොහෝකොටම පවතින්නේ, විසල් හා පොදු අදහසක් ලෙසය. චීන ආන්ඩුව මාර්තුවේදී, "සේද මාවතේ ආර්ථික තීරුව හා 21 වන සියවසේ නාවික සේද මාවත ඒකාබද්ධව ගොඩනැගීමේ දැක්ම හා ක්‍රියාවලිය" යන හිසින් ලිපියක් පල කලේය. සංයුක්ත කරුනු කෙටියෙන් ද "සාමකාමී සංහිඳියාව" පිලිබඳ දිග පුරාජේරු වලින් ද ගහන එය, "සහයෝගය දිනාගැනීම" හා සමීප ආර්ථික ඒකාග්‍රකරනයේ වාසි ගැන කථාකරයි.

මේ දක්වා ප්‍රසිද්ධියට පත්ව තිබෙන පරිදි එම සැලසුම් වලට, ගොඩබිම් තීරුවෙහි යුරෝපයට වැටී තිබුනු ඓතිහාසික සේද මාවතේ ආරම්භක ලක්ෂ්‍යය වන සියෑන් යන චීන නගරයේ සිට, බටහිර චීනයේ සින්ජියෑන් ප්‍රාන්තයෙහි උරුම්කි හා මධ්‍යම ආසියාව හරහා මොස්කෝවට ද යුරෝපයට ද දිව යන ප්‍රධාන මාර්ගයක් හා කිලෝ මීටර් 80,000ක් දිග අධි වේගී දුම්රිය මාර්ගයක් ඉදිකිරීම ඇතුලත්ය. අනෙකුත් දුම්රිය මාර්ග වලට, ගිනිකොන දිග ආසියාව හරහා දකුනු චීනයේ සිට සිංගප්පූරුව දක්වා වන මාර්ගයක් ද සින්ජියෑන්හි සිට පකිස්ථානය හරහා අරාබි මුහුදේ චීනය විසින් ඉදිකර ඇති ග්වඩාර් වරාය දක්වා වන මාර්ගයක් ද ඇතුලත්ය.

බල ශක්ති නිපැයුම හා බල ශක්ති ජාලයන් සමග මාර්ග, තෙල් හා ගෑස් නල මාර්ග, සංඛ්‍යාංක කේබල් රැහැන් ඇදීමේ ප්‍රධාන ව්‍යාපෘති සැලස්මට ඇතුලත් වේ. චීනයේ ඌන සංවර්ධිත අභ්‍යන්තර කලාපවල වේගවත් ආර්ථික වර්ධනයක් ඇති කිරීම ද එරට අධි නිෂ්පාදිතයන් සඳහා පිටවුම් මාර්ගයක් හා චීන සමාගම් සඳහා ලාභදායී අවස්ථා ද නිර්මානය කිරීම එහි ඉලක්කයන් ලෙස පවතී.

විශේෂයෙන්ම, චීනයේ සිට යුරෝපයට හා අප්‍රිකාව ඒකාග්‍ර කරන කෙන්යාව දක්වා, ගිනිකොන දිග ආසියාවේ මුහුදු මාර්ග හා වරාය පහසුකම් සංවර්ධනය කෙරෙහි, මුහුදු මාර්ගය තුලින් අවධානය යොමුකර තිබේ.

බීජිනය යෝජනා කර ඇත්තේ, දැවැන්ත පරාසයක යටිතල ව්‍යුහ ව්‍යාපෘතීන්ට මූල්‍ය සම්පාදනය පිනිස ඩොලර් ට්‍රිලියන 1.4ක් යෙදවීමටය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක බැංකුව හා ආසියානු සංවර්ධන බැංකුව පසෙකින් මූල්‍ය සංස්ථා පිහිටුවීමට ද යෝජනා කෙරී ඇත. මුදල් පහසුකම් සැලසීම සමග එක්ව චීනය, ආර්ථික ඒකාග්‍රකරනයට පවතින වෙලඳ බාධක, ආර්ථික තහංචි, හා අනෙකුත් බාධාවන් ඉවත් කිරීමට හෝ අවම කිරීමට පියවර හා ගිවිසුම් ඇතිකර ගැනීමට කැඳවුම් කර තිබේ.

අඩුම තරමින් ඩොලර් බිලියන 100ක අරමුදල් සැලසුම් කර තිබෙන මෑතක පිහිටුවන ලද ආසියානු යටිතල ආයෝජන බැංකුවට චීනය ආරම්භයේදී බිලියන 50ක් යොදවා ඇත. තවත් බිලියන 40ක්, මධ්‍යම ආසියාවේ ව්‍යාපෘතීන් සඳහා සේද මාවත අරමුදලට බැරකර ඇත. චීන-පකිස්ථාන ආර්ථික කොරිඩෝව සඳහා අරමුදල් සම්පාදනයට බිලියන 46ක් යොදවන බව චීනය නිවේදනය කර තිබේ. පසුගිය අගෝස්තුවේදී බ්‍රික්ස් රටවල මූලිකත්වයෙන් පිහිටුවන ලද නව සංවර්ධන බැංකුවට තවත් බිලියන 10ක් චීනය විසින් යොදවනු ලැබ තිබේ. එක් තීරුවක් එක් මාවතක් ව්‍යාපෘතීන් වලට ඩොලර් ට්‍රිලියනයක් යොදවන බව චීන සංවර්ධන බැංකුව නිවේදනය කලේය.

ව්‍යාපෘතීන් පූර්න පරිමානව ක්‍රියාවට නැගීම 2021න් ආරම්භවී 2049දී නිම කිරීමේ බලාපොරොත්තුවෙන්, ආසියානු යටිතල ආයෝජන බැංකුවේ හවුල්කරුවන් සමග යෝජනා ක්‍රම සැලසුම් කිරීමේ 5 අවුරුදු කාල වකවානුව ලබන වසරෙන් ඇරඹීමට චීන ආන්ඩුව යෝජනා කර ඇත.

එම ව්‍යාපෘතියේ ආර්ථික බලාපොරොත්තු දැනටමත් යුරෝපය තුල බලපෑමට පටන්ගෙන ඇත. මාර්තුවේදී බ්‍රිතාන්‍ය, ඇමරිකාව සමග මිතුදම කඩ කරමින්, චීනයේ අනුග්‍රහය සහිත ආසියානු යටිතල ආයෝජන බැංකුවට එකඟ වූයේ ඉන් විවෘත කරන මූල්‍යමය අවස්ථාවන්හි වාසිය ගැනීමටය. අනෙක් යුරෝපීය බලවත්තු ද ඉක්මනින්ම ඒ මග ගත්හ. චීන උගතෙකු වන වැන් යිවේ මෙසේ පැවසීය. "නව සේද මාවතට මුලපිරීම, භූ-දේශපාලනික ගුරුත්වාකර්ෂන කේන්ද්‍රය ඇමරිකාව වෙතින් යලිත් යුරෝපය තුල පිහිටුවීමට හැකියාව ඇති කරයි. මෑතකදී ප්‍රන්සය, ජර්මනිය, ඉතාලිය හා බ්‍රිතාන්‍යය, ආසියානු යටිතල ආයෝජන බැංකුවට එක්වීමට ගත් තීන්දුව යොමු වන්නේ ඒ දිසාවටයි. එසේම ආසියාව කෙරෙහි, විශේෂයෙන්ම චීනය කෙරෙහි යුරෝපීය ආකල්පයේ ප්‍රධාන වෙනසක් මෙයින් සලකුනු කෙරේ. එය පැහැදිලිවම ඇමරිකානු ආස්ථානයෙන් වෙන්වීමකි."

තමන් කොන්කර නැතිනම් මුලුමනින්ම බැහැරකර, යුරේසියාව ඒකාග්‍ර කිරීම සඳහා මුල පිරීමට චීනය හා යුරෝපීය බලවතුන්ට ඉඩදී බලා සිටින්නට, ඇමරිකානු අධිරාජ්‍යවාදය සූදානම් නොවනු ඇත. දිගු කාලයක් තිස්සේ ඇමරිකානු මූලෝපායඥයින් විසින් සලකනු ලැබ ඇත්තේ, ලෝක ජනගහනයෙන් සියයට 70ක් හා ගෝලීය නිමැවුමෙන් හරි අඩක් හිමිකර ගන්නා කලාපයක් වන යුරේසියාව, සිය ගෝලීය ආධිපත්‍යයට නැතිවම බැරි බවටය.

1997දී පල කල *The Grand Chessboard* (මහා චෙස් පෙත) නම් කෘතිය තුල හිටපු ඇමරිකානු ජාතික ආරක්ෂක උපදේශක සිබිග්නිව් බ්‍රෙසන්ස්කි මෙසේ ලිවීය: "ඇමරිකාවට නම් ප්‍රධාන භූ-දේශපාලන ත්‍යාගය යුරේසියාවයි...යුරේසියාව ලෝකයේ විශාලතම මහාද්වීපය හා භූ-දේශපාලන අක්ෂයයි. යුරේසියාව මත අධිකාරය දරන බලවතා, ලෝකයේ වඩාත්ම දියුනු හා ආර්ථික වශයෙන් පලදායී කලාප දෙකක් පාලනය කරනු ඇත...එබැවින් යුරේසියාව, ගෝලීය ආධිපත්‍යය සඳහා අරගලය සිදුවනු ඇති චෙස් පෙතයි."

සෝවියට් සංගමය බිඳ වැටුනු 1991 පටන් ඇමරිකාව, මහා යුරේසියානු භූ ස්කන්ධය සිය අධිකාරය යටතට ගැනීමට උනන්දු විය. පලමු වරට 1999දී ගෙනහැර දැක්වුන තමන්ගේම සේද මාවත මූලෝපාය, මධ්‍යම ආසියාවේ හා කෝකසස්හි පැරනි සෝවියට් සමූහාන්ඩු තුල කුමන්ත්‍රන හා මැදිහත්වීම් මෙහෙයවීමේ ගාමකය විය. ඇමරිකාවේ මූලිකත්වයෙන් සිදු කල ඇෆ්ගනිස්ථාන ආක්‍රමනයට හා එරට රූකඩ තන්ත්‍රයක් පැලපදියම් කිරීම සඳහා වොෂින්ටනයට "ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය" කඩතුරාව මෙන්ම යාබද මධ්‍යම ආසියාවේ මෙහෙයුම් සඳහා පදනම ද සම්පාදනය කලේය.

විස්තාරනය කරන ලද හෝ අවශ්‍යයෙන්ම තර්කාන්විත මූලෝපායක් නොවුන ද ඔබාමා පාලනයේ "ආසියාවට හැරීම" හා එයටම බැඳුනු යුක්‍රේන හා සිරියානු ප්‍රකෝපකරන හා මැදිහත්වීම් අප්‍රකාශිතවම තල්ලු වුනේ, යුරේසියානු භූ ස්කන්ධය ඇමරිකානු ආධිපත්‍යය යටතට ගැනීමේ අටියෙන් චීනය හා රුසියාව කැබලි කර යටත් කිරීම දෙසටය.

අන්තර් පැසිෆික් හවුල්කාරිත්වය (ටීපීපී) ගැන කථාකරමින් ඔක්තෝබරයේදී ජනාධිපති ඔබාමා පැවසුවේ, "අපගේ විභව ගනුදෙනුකරුවන්ගෙන් සියයට 95කට වඩා අපගේ රටින් පිට සිටියදී, චීනය වැනි රටවලට ගෝලීය ආර්ථිකයේ නියාමයන් සලකුනු කිරීමට ඉඩ හැරීමට පුලුවන් කමක් නැත. නියාමයන් සලකුනු කල යුත්තේ අපය." එහෙත් ටීපීපී හා පසුගිය දශක තුන පුරා සිදුකල ආකාරයට, යුරෝපය සඳහා වන එහි අනෙක් පාර්ශවකරු වන අන්තර් අත්ලාන්තික් වෙලඳ හා ආයෝජන හවුල්කාරිත්වය හරහා ඇමරිකාවට, ලෝකය මත කොන්දේසි නියම කල නොහැක්කේ නම්, ඔවුන් විශ්වාසය තබනු ඇත්තේ මිලිටරි ප්‍රකෝපකරන, මැදිහත්වීම් හා යුද්ධය මතය.

යුරේසියාව සාමකාමීව ඒකාග්‍ර කිරීම පිලිබඳ එක් තීරුවක් එක් මාවතක් යෝජනා ක්‍රමයේ දැක්ම තවදුරටත් එක්සත් යුරෝපයක් පිලිබඳ දර්ශනයට වඩා ශක්‍ය වන්නේ නැත. ගැඹුරු වන ගෝලීය ආර්ථික අර්බුදය මගින් අවුලුවන යුරෝපීය, ඇමරිකානු හා ජපන් අධිරාජ්‍යවාදී බලවතුන් අතර බෙදීම් හා එදිරිවාදිකම්, එකිනෙකා තම තමන්ගේ අවශ්‍යතා පෙරදැරි කරගෙන කටයුතු කිරීම මගින් උග්‍ර වනවා පමනි. ප්‍රමුඛ අස්ථායීකාරී සාධකය ඇමරිකානු අධිරාජ්‍යවාදයයි. එය යලි යලිත් පෙන්නුම් කර ඇත්තේ, ව්‍යසනකාරී යුද්ධයක් තුලට ලෝකය ඇද දැමිය හැකි වුව ද සිය ඓතිහාසික පරිහානිය, මිලිටරි මාධ්‍ය යොදාගනිමින් ජය ගැනීමට ඇති ඔවුන්ගේ අධිෂ්ඨානයයි.

© www.wsws.org